# 01.<u>පරිගණක සහ පර්යන්ත උපාංග මිලදී ගැනීම සඳහා පිරිවිතර සැකසීම.</u>

## පරිශිලකයා යනු කව්ද?

පරිගණකය පරිහරණය කරන පුද්ගලයා පරිශීලකයා ලෙස හඳුන්වයි. තොරතුරු හා සන්නිවේදන ක්ෂේත්‍රයේ විවිධ පරිශීලකයෝ සිටියි.

උදා :
- ක්‍රමලේඛක
- මෘදුකාංග ඉංජිනේරු
- වෙබ් සංවර්ධක
- ජාල පරිපාලක

**<u>ක්‍රියාකාරකම</u>**

**පරිගණකය ඇසුරෙන් ඉටු කර ගැනීමට හැකි කාර්යයන් 5ක් ලියා දක්වන්න.**

1. ..................................................................................................................................
2. ..................................................................................................................................
3. ..................................................................................................................................
4. ..................................................................................................................................
5. ..................................................................................................................................

## <u>පරිගණක වර්ගීකරණය</u>

පරිගණක වල ස්වභාවය සහ භාවිතය අනුව ඒවා ප්‍රධාන වර්ග දෙකකට බෙදා වෙන් කල හැකිය.
- නිශ්චිත ස්ථානයක තබා භාවිතා කරන පරිගණක
- ජංගමව භාවිත කල හැකි පරිගණක

## <u>නිශ්චිත ස්ථානයක තබා භාවිතා කරන පරිගණක</u>

මෙම පරිගණක ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රධාන විදුලි බල සැපයුමක් ඔස්සේ විදුලිය ලබා දිය යුතු වේ. මේවා ප්‍රමාණයෙන් විශාල වන අතර බරෙන් වැඩිය. එම නිසා නිශ්චිත ස්ථානයක ස්ථාපිත කර භාවිතා කරයි.

උදා :
- සේවාදායක පරිගණක
- මේස පරිගණක



සේවාදායක පරිගණක



මේස පරිගණක

## ජංගමව භාවිත කල හැකි පරිගණක

මෙම පරිගණක සඳහා නැවත ආරෝපනය කල හැකි බැටරියකින් විදුලි බලය ලබා ගනී. එම නිසා අපට අවශ්‍ය ඕනෑම ස්ථානයක සිට මෙම පරිගණක භාවිතා කල හැකිය.

උදා :

- උකුළු පරිගණක (LAPTOP)
- නෝට්බුක් පරිගණක (NOTEBOOK)
- ටැබ්ලට් පරිගණක (TABLET COMPUTERS)
- සුහුරු ජංගම දුරකථන (SMART PHONES)



උකුළු පරිගණක (LAPTOP)



නෝට්බුක් පරිගණක (NOTEBOOK)



ටැබ්ලට් පරිගණක (TABLET COMPUTERS)



සුහුරු ජංගම දුරකථන (SMART PHONES)

(උපදෙස් : වැඩ පොතේ ක්‍රියාකාරකම 1.1 සහ 1.2 කරන්න.)